# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1756/30 - 2012 මැයි 04 වැනි සිකුරාදා - 2012.05.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**රේගු නිවේදනයයි**

**රේගු ආඥා පනතේ (235 වැනි අධිකාරය) 101 වගන්තිය යටතේ වූ නියෝග**

දත්ත සැකසුම් යන්ත්‍රයන්හි භාවිතා කරන මෘදුකාංග සහිත වාහක මාධ්‍ය සඳහා රේගු වටිනාකම නිර්ණය කිරීම

1. රේගු ආඥා පනතේ (235 වැනි අධිකාරය) 101 (1) (h) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම පහත දැක්වෙන නියෝග, වෙළඳ හා බදු සම්බන්ධ පොදු ගිවිසුමෙහි VII වන ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුම සමඟද අනුකූල බවට සෑහීමකට පත්වී මෙසේ පනවමි. මින් මතුවට, ආනයනය කරනු ලැබූ දත්ත හා උපදෙස් (මෘදුකාංග) සහිත වාහක මාධ්‍ය සඳහා රේගු වටිනාකම නිර්ණය කිරීමේදී ගණන් ගත යුතු වන්නේ එම වාහක මාධයේ අගය පමණි. ඒ අනුව, දත්ත හා උපදෙස් (මෘදුකාංග) වල අගය සහ වාහක මාධ්‍යයහි අගය වෙන් වෙන්ව දක්වා ඇති විට, රේගු වටිනාකම නිර්නය කිරීමේදී, දත්ත හා උපදෙස් (මෘදුකාංග) හි අගය එකතු නොකළ යුතුය.

2. මෙම නිවේදනයේ සඳහන් වාහක මාධ්‍ය වශයෙන් අනුකලිත පරිපථ, අර්ධ සන්නායක සහ සමාන උපක්‍රම හෝ උපාංග සැලකිය යුතු නොවන අතර දත්ත හා උපදෙස් වශයෙන් ශාබ්දික, දෘශ්‍ය සිනමා හෝ වීඩියෝ පටිගත කිරීම් සැළකිය යුතු නොවේ.

3. මෙම නියෝග, රේගු වටිනාකම සඳහා වන 2012(2) නියෝග ලෙස හඳුන්වනු ලබන අතර, 2012 මැයි 04 වැනි දින සිට ක්‍රියාත්මක වන්නේය.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2012 අප්‍රේල් මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

05 - 520


1A - G 015994 — 485 (2012/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.